**ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සම්බන්ධතා හා ක්‍රමෝපාය අධ්‍යයන ආයතනය - 2016**

**-----------------------------------------------------------------------------------------------**

ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සම්බන්ධතා හා ක්‍රමෝපාය අධ්‍යයන ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2006 අංක 32 දරන උපාය මාර්ග අධ්‍යයනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතන පනතින් සංශෝධිත 2000 අංක 45 දරන උපාය මාර්ග අධ්‍යයනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතන පනතේ 10(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වන වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

---------------

**2.1 තත්ත්වාගණනය කළ මතය**

------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සම්බන්ධතා හා ක්‍රමෝපාය අධ්‍යයන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---------------------------------------------

**2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

------------------------

රාජ්‍ය ප්‍රදාන ගිණුම් තැබීම සම්බන්ධයෙන් ආයතනය විසින් ගිණුම් ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණ ද රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදානයන් ලෙස සමාලෝචිත වර්ෂයේ දී ලැබී තිබුණු රු.5,500,000 ක් මූල්‍ය කාර්යසාධන වාර්තාවේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

---------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජාත්‍යන්තර සබඳතා හා උපායමාර්ග අධ්‍යයනය පිළිබඳ ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනය පිහිටුවීම සම්බන්ධයෙන් 2006 ජනවාරි 24 දිනැති අංක අමප/06/0202/214/003 දරන අමාත්‍ය මණ්ඩල තීරණයේ (අ) වගන්තිය අනුව රජයේ ඉඩම් ආඥාපනත යටතේ අතිගරු ජනාධිපතිතුමා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම මගින්, කොළඹ 07, හෝර්ටන් පෙදෙසේ, අංක 24 දරන ස්ථානයේ පිහිටි දේපළවල හිමිකාරත්වය ආයතනය වෙත පවරාදීම සඳහා අනුමැතිය ලබාදී තිබුණි. එහෙත් එම දේපළ පවරා ගැනීමට හා තක්සේරුකර ගිණුම්ගත කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබූ අතර එම දේපළ වැඩිදියුණු කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වැයකරන ලද එකතුව රු.3,189,193 ක් පමණක් ප්‍රාග්ධනිත කර තිබුණි.

(ආ) 2016 වර්ෂයේ දී බණ්ඩාරනායක ජාත්‍යන්තර පුහුණු ආයතනයේ පුස්තකාලය වෙත පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ පොත් 71 ක් අගය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) ආයතනයේ සමාලෝචිත වර්ෂයේ වරිපනම් ගාස්තු රු.363,440 ක් ලෙස තක්සේරු කර ඇතත් ගෙවා තිබූ රු.90,860 ක ගාස්තුව පමණක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අතර, ගෙවිය යුතුව ඇති රු.272,580 ක් ගිණුම්ගත කර නොතිබුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

ආයතනයේ උපචිත වියදම්වල 2011 වර්ෂයේ සිට පැවත එන බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවට ගෙවිය යුතු රු.6,744,288 ක්, 2014 වර්ෂයේ සිට පැවත එන සංග්‍රහ වියදම් රු.62,000 ක් හා විගණන ගාස්තු රු.150,000 ක් සමාලෝචිත වර්ෂයේදී ද පියවීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ආයතනයේ වටිනාකම රු.1,918,680 ක් වූ පරිගණක උපාංග සම්බන්ධයෙන් සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර පුහුණු ආයතනයේ වටිනාකම වෙන් කර හඳුනාගත නොහැකි පරිගණක උපාංග සම්බන්ධයෙන් පරිගණක ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ආ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 9.3.1 වගන්තිය | ආයතනයේ අනුමත තනතුරු සඳහා බඳවා ගැනීම් හා උසස් කිරීමේ පරිපාටියක් සකස් කර අමාත්‍යාංශයේ හා භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමට කටයුතුකර නොතිබුණි. |
| (ඇ) | 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.2. ඡේදය | ආයතනය සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර තානාපති පුහුණු ආයතනයේ සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණය සිදුකර වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

# 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 7,797,868 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 8,490,821 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයෙහි මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 692,953 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී පොලී හා කුලී ආදායම් රු.3,587,768 කින් වැඩි වීම සහ සැපයුම්, පාරිභෝජන හා වෙනත් වියදම් රු. 11,735,000 කින් අඩු වීමක් සිදු වුවද, කාර්ය මණ්ඩල වියදම රු. 5,863,072 කින් වැඩිවීම හා පාඨමාලා ගාස්තු ආදායම රු. 10,430,644 කින් අඩුවීම පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2012 වර්ෂයේ රු.3,367,328 ක් වූ අතිරික්තය 2013 වර්ෂයේදී රු. 1,691,956 ක් දක්වා අඩු වී තිබුණ ද, නැවත 2016 වර්ෂය දක්වා අඛණ්ඩව මූල්‍ය ප්‍රතිඵලය වර්ධනය වී තිබුණි. කෙසේ වුව ද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් නැවත ගැලපීමේ දී 2012 වර්ෂයේ දී රු.10,584,430 ක් වූ ආයතනයේ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු. 22,745,608 ක් වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

### 4.1 කාර්යසාධනය

---------------

2006 අංක 32 දරන උපාය මාර්ග අධ්‍යයනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතන (සංශෝධන) පනතේ 5 වගන්තිය ප්‍රකාරව ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනයේ කර්තව්‍යයන් පහත පරිදි වේ.

- රාජ්‍ය ආරක්ෂාව, ජාතික ආරක්ෂාව, නීතිය, ආර්ථික විද්‍යාව, සංස්කෘතික සම්බන්ධතා, කෘෂිකර්මය සහ පරිසරයට අදාල තොරතුරු ඇතුළු ජාත්‍යන්තර සම්බන්ධතා සහ උපාය මාර්ග අධ්‍යයනයන්ට අදාළ ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම සහ ව්‍යුහගත කිරීම සඳහා වූ තොරතුරු හා දත්ත රජයට සැපයීම.

- උපාය මාර්ග අධ්‍යයනයන්ට සහ ජාත්‍යන්තර සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීමේ පර්යේෂණවලට හා අධ්‍යයනවලට අධාර කිරීම හා ඒ භාරගන්නා තැනැත්තන් පුහුණු කිරීම.

- ශ්‍රී ලංකාවට අදාළ වන උපාය මාර්ග අධ්‍යයනයන් සහ ජාත්‍යන්තර සම්බන්ධතා පිළිබඳ සාකච්ඡා කිරීම, විශ්ලේෂණය කිරීම සහ ඇගයීම සඳහා පසුතලයක් සලසා දීම සඳහා කලාපය තුල සහ ජාත්‍යන්තර වශයෙන් ඒකාබද්ධ අධ්‍යයනයන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පැවැත්වීම.

- උපාය මාර්ග අධ්‍යයනයන්ට සහ ජාත්‍යන්තර සම්බන්ධතාවලට කැපවී ඇති පුස්තකාලයක් ඇතුළු තොරතුරු ගබඩාවක් පිහිටුවීම සහ විෂයපථයට ගැනෙන කරුණුවලට අදාළ වාර සඟරා හා ලිපි පළ කිරීම.

- ශ්‍රී ලංකාව මෙන්ම වෙනත් රටවල ද සමාන අරමුණු සහිත පුද්ගලයන්, සංවිධාන, රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන සමඟ සම්බන්ධතා හා මිත්‍රත්වයක් පවත්වාගෙන යාම.

- රාජ්‍යතාන්ත්‍රික කටයුතු ජාත්‍යන්තර සම්බන්ධතා සහ මණ්ඩලය විසින් උචිත යයි සලකන වෙනත් අදාල ක්ෂේත්‍ර සම්බන්ධ පුහුණු වැඩසටහන් පැවැත්වීම.

ඉහත අරමුණු ඉටු කර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ ඉහත සඳහන් කර්තව්‍යයන් ඉටු කර ගැනීමට අදාළ භෞතික ඉලක්ක දක්වා නොතිබුණි. එසේ වුවද, පනතේ සඳහන් අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා ආයතනය විසින් සමාලෝචිත වර්ෂයේදී උපාය මාර්ගික අධ්‍යයනයන් සහ ජාත්‍යන්තර සම්බන්ධතා පිළිබඳ දේශන 12 ක් ද, සාකච්ඡා 06 ක් ද පවත්වා තිබූ අතර, විෂය පථයට ගැනෙන කරුණුවලට අදාළ වාර සඟරා හා ලිපි 04 ක් පමණක් පළ කර තිබුණි.

(ආ) පනත ප්‍රකාරව, ආයතනය බහුවිධ පුහුණු පර්යේෂණ ආයතනයක් වශයෙන් ක්‍රියාත්මක විය යුතු අතර, 2016 වර්ෂයේදී, පර්යේෂණයන්ට අදාළව එක් වැඩ පත්‍රිකාවක් (Working Paper) පමණක් පළකර තිබුණි.

(ඇ) පනතේ 10 (ඉ) වගන්තිය ප්‍රකාරව ආයතනයට වගකිව යුතු ඒකකයක් වශයෙන් බණ්ඩාරනායක ජාත්‍යන්තර තානාපති පුහුණු ආයතනයේ කර්තව්‍යයන් ලෙස පුහුණු වැඩසටහන් සහ වෙනත් අධ්‍යයන පාඨමාලා ක්‍රියාත්මක විය යුතු අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) බණ්ඩාරනායක ජාත්‍යන්තර තානාපති පුහුණු ආයතනය විසින් 2016 වර්ෂයේ පැවැත්වීමට සැලසුම් කළ අධ්‍යයන වැඩසටහන් 08 න් වැඩසටහන් 02 ක් පමණක් පවත්වා තිබුණු අතර, සැලසුම් නොකළ පුහුණු වැඩසටහනක් ද පවත්වා තිබුණි.

(ii) 2014, 2015 හා 2016 කාල පරිච්ඡේදය තුල රාජ්‍යතාන්ත්‍රික හා ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව පිළිවෙලින් 174 ක් 281 ක් හා 299 ක් වූ අතර ඒ ඒ වර්ෂවල පාඨමාලාව සාර්ථකව නිම කළ ශිෂ්‍ය සංඛ්‍යාව පිළිවෙලින් 124 ක්, 170 ක් හා 152 ක් විය. ඒ අනුව පාඨමාලාව නිම කළ ශිෂ්‍ය සංඛ්‍යාව පිළිවෙලින් සියයට 71 ක්, සියයට 60 ක් හා සියයට 50 ක් ලෙස ක්‍රමයෙන් අඩුවීමක් පෙන්නුම් කෙරුණි.

(iii) බණ්ඩාරනායක ජාත්‍යන්තර තානාපති පුහුණු ආයතනයේ 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේදී පාඨමාලා ගාස්තු ආදායම සියයට 54 කින් අඩු වී තිබුණි. පාඨමාලා ආදායම අඩුවීමට අමාත්‍යාංශය විසින් පවරන ලද පාඨමාලා ප්‍රමාණයේ අඩුවීම හේතු වූ බැවින් එම ප්‍රමාණය වර්ධනය කරගැනීමට අවධානය යොමු වී නොමැති බව නිරීක්ෂණය විය.

**4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සිදුකළ භාණ්ඩ සමීක්ෂණයෙන් ආයතනයේ නිෂ්ක්‍රීයව පවතින භාණ්ඩ වර්ග 12 ක් ඉවත් කිරීමට නිර්දේශ කර ඇති නමුත්, විගණිත දිනය වූ 2017 අගෝස්තු 01 වන විටත් ඉවත් කිරීමට කටයුතු නොකර ආයතන පරිශ්‍රයේ ගොඩගසා තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**5.1 ක්‍රියාකාරී සැලැස්ම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව එහි සඳහන් කරුණු ඇතුළත් කොට ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර නොතිබුණි.

**5.2 ප්‍රසම්පාදන සැලැස්ම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 (ඇ) ඡේදය ප්‍රකාරව ලක්ෂ්මන් කදිර්ගාමර් ආයතනය සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර තානාපති පුහුණු ආයතනය විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය ප්‍රකාරව 2007 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**6.** **පද්ධති හා පාලනයන්**

---------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා ආයතනයේ විධායක අධ්‍යක්ෂවරයා වෙත වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| **පද්ධති හා පාලන ක්ෂේත්‍ර** | **නිරීක්ෂණ** |
| --- | --- |
| (අ) පාඨමාලාව සඳහා සිසුන් බඳවා ගැනීම. | බඳවාගත් සිසුන්ගේ සුදුසුකම් සනාථ කෙරෙන සහතිකවල ඡායාස්ථ පිටපත් හෝ වෙනත් ලියවිලි කිසිවක් රඳවාගෙන නොතිබීම. |
| (ආ) පොත්පත් හා ලේඛන පවත්වා ගැනීම. | ආයතන දෙකට අදාළව වටිනාකම රු. 19,081,940 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබීම. |